


නිර්මාණ අඩවිය

ඉඳ හිට දවසක
www.ketapathpawra.com
අඩවියට ගොඩවන්න

## නදී ගීතය

දුරු රට තැනක කඳු මුදුනක ජනිතවෙලා
මිණිකැට වගේ දිය බිඳු රැස එකතුවෙලා
කුඩ මසු කෙළින නොගැඹුරු දිය පාර බලා
ගැමි රස විඳිමි මල් සුවඳින් ඔකඳ වෙලා.

අතොරක් නැතිව වහිනා මහ වැසි දාට
පෙන පිඬු නගා ගැලුවත් නැත බොර පාට
රැක ගති සොබාදම හැඩරුව හිමි ඇට
කැලලක් කල නොහැක පුහුදුන් මිනිසාට

තිබහට වතුර බොන්නට බැරි සයුර බලා
ගලනා නිබඳ කාලයෙ ගම් නියම් පෙලා
මඟ දිග රැඳුන නෙක නෙක ගති රැගෙන වෙලා
ගැඹුරැය බිඳෙන් බිඳ ඇත ඈ පුලුල් වෙලා.

පාරම් බාන ගඟුලක දිග පලල බලා
මිනිසුන් ඇතත් මිහිකත මත ජනිත වෙලා
නින්දා වැස්ස වසිනා මඟ දිගට ගලා
ගඟුලේ තිගෙ බොරදිය හද සසල කලා.

නිසසල ගැඹුරු බොරවූ තිගෙ දිය පතුලේ
දැති මෝරුන්ට නිජබිම් කර දූන් ගඟුලේ
පැතිරෙන කිරණ තවමත් නැගි සඳමඬලේ
ඇතිමුත් නොමැත රස බිහිවුන ගම වඳුලේ.

මහ නැව් යතත් දිය ගඟුලේ සයුරු තොට
නැහැ කිසි අගය තිගෙ ගැඹුරේ පලලෙ මට
ගංතෙර වැතිර තණ නිල්ලේ සිටින විට
සිහිනෙන් පෙනේ දිය පාරේ පැහැය මට.

**විජයසිරි තිලකුමාර**

## දෙශප්‍රේමයේ වෙනස

පහන් විය එකොලොස් වැනි දිනේ
මසක් වූ බිනර මසේ
හැඟුම් බර විය රට කෙරේ
තැබුවෙමි පියවර නගරය කෙරේ

දුටුව දසුනින් නෙත පිනා ගිය
වැඩුණු ඔද තව මගේ සිත තුළ
නැවත ගම් දොර බලා එන විට
මතක් විය මෙල්බන් පොරේ මට

මුරලි ඉන්නත් අප රටේ මය
වැනුනි කොඩි සැම භේද නොමැතිව
එදින වැනුනෙත් රටක් දිනුමට
මෙදින වැනුනෙත් රටක් දිනුමට

වනන්නට කොඩි අප සැම එකා ලෙස
රැක ගත යුතුය අප සැම දිනූ රට
පැරදුනොත් අප සැම දිනූ රට
වනන්නේ කොඩි කුමන රටකට

**අනුර පනාගොඩ**
ග්ලැඩ්ස්ටන්පාක්

## වෙනස

සඳ එළිය ගලා යන
සඳළු තලයේ කොනක
නිහඬතාවට පෙමින
දෙදෙන මුවගින් නොබැන

අතු ඉති ගස් මුදුන
මුදු සඳ එළිය පෙරමින
මඳ සුළඟ සමගින
පෙම් බස් සෙමින් මුමුණන

සුදු වළා පුළුල් උර
තුරුළු කර සඳ මඬල
පෙම් තෙපුල් කොඳුරමින
නොඇසෙනා තරමටම

සඳ එළිය ගලා යන
සඳළු තලයේ කොනක
රත් පැහැ වුවන දෙනයන
පිටුපා හැරී උනුන ට

**පාලිත ගනේවත්ත**
සිඩ්නි

## හාන් නේ .... මේ අපෙ රාළහාමි නේද?

කා....ග්ගෙද යකෝ මේ - බබ්.... බල්ල මට බුරන
දන්නැද්ද පර බල්ලො - මේ යන්නෙ මං කියල

වහප්පිය තොගේ කට - උලනවා බිම හොම්බ
අඳුන් ....නන්.... නැද්ද මූ - වැද්ද.... ගත් උත්තමයො

පාරෙ යන්නත් නෑනෙ - අපි ව්.... වගෙ කෙනෙකුටත්
මුංගෙ මේ බලු හැත්ත - මහ සොහොං අවතාර

හාන් නේ .... මේ අපේ - රාළහාමී නේ ද
කොහෙද දෙය්යෝ මෙහේ - මේ දෙගොඩ හරි ජාමෙ?

තොත් තොපට මොක්..කටද - මං ය..න්..න එන්..න තැං
අහපු හැටි කුණු හරුප - පුරස්නය මුම් මගෙං

තොත් තොපේ බල්ලා ද - උඩු බුරන්නේ මෙතන ?
බැඳල තියපල්ල මූ - මං එනව දැක්කාම

හොඳයි හොඳමයි අපේ - රාළහාමී හොඳයි
මිම් පස්සෙ අපි හොඳට - ඉන්නංකො බලාගෙන

මී හරක් දැක්කාම - බුරා ගෙන පැන්නාට
මූ එහෙම බුරන් නෑ - මනුස්සයො දැක්කාට

රැවටිලා වෙන්ටැති - අද රාළහාමී ට
මූට අද අමු කැවිල - පල යන්න කඩිය ගෙට

තරහ ගන්නේ නැතුව - අපෙ දෙය්යො දැං ඉතිං
අනේ යහපත් වෙන්න - හීතලයි අද හරි ම

දාවිත් අද ගමේ ගියා - මෙයා එහේ ගිහිං ලැගල
කණමදයා වගේ එන්නෙ - සාමෙල්ගෙං පිනට බීල

**වි ක ධර්මබන්ධු**



## සංසාර පැතුම

මා සංසාරයෙහි පැතු ලෙසින් ම
ඒ නොසිතූ විලසින්ම
හැඳිනගති මා රන්වන් ඔබේ
හදවත
දෙමාපිය සොයුරී අතරටද
සෙනෙහසින් ළං වෙමින්
සැමගේ ආශිර්වාදයෙන්
මගේ දිවියට ළං වුණේ
වෙන් නොවෙමු මතු බවෙත්
සසර පැතු ලෙස
ලංව ඉමු සෙනෙහසින්

**දිල්රුක්ෂි ඉඹුලාන**
රොක්ස්බර්ග්පාක්

## සුනාමියෙන් මාස හයකට පසු මා දුටු ලංකාව

සුනාමිය ඇවිත් ගිය දවස නම් සෙයිලමේ
නෝනලා මහත්තුරු අවා ගියා පෝලිමේ
ආදාරෙකට ලැබුනු දිරපු කූඩාරමේ
ඉරුනු නැති තැනක් නැත වැසි වැටෙන කල තෙමේ

රස්නේ දෙන අව් සැරට තහඩුවෙන් ටකරෙමේ
හෙවන ලද සිප් හලේ ඇද ගහුන බන්කුවේ
ඉදෙන බත කුස පුරා අහර නැත කිසි කලේ
සුනාමිය ඇවිත් ගිය, අපි තවම කඳවුරේ

සිනාමුව කට පුරා පුරෝගෙන පෝලිමේ
ඉන්ටර කූලර වලින් මහත්තුරු තරඟයේ
ජන්ද ඉල්ලන්ට එයි වහ වැටි එක පොරේ
සුනමිය ඇවිත් ගිය අපි තවම පල්ලමේ

**බෝදිනි රන්මැණික් සමරතුංග**
ලැට්විියා



## ඉඟි නළුව

වැසුණු තිර එසවේ
දහස් නෙත් යොමුවේ
පෙම්වතා මම පෙම්වති ද මම
රඟන ඉඟිනළුවේ

පලා යමි මම නැවත එමි මම
සිනාවෙමි මම හඬන්නෙමි මම
මගේ ඉඟිනළුවේ

රැගුම් කදිමැයි ඇසෙයි ජයගොස
හුදී ජනයින් ගසති අත්පුඩි
මහද වැලපෙනු මට ඇසේ

**ශ්‍රීයා කුමාරසිංහ**
නවසීලන්තය




උඳුවප් මහේ සිහිතල මුසුවෙමින් එන
සුළඟත් සනීපයි මව්බිම දෙසින් එන
සිතිවිලි තරඟ හොර රහසෙම ගූවන් ගෙන
ගමරට බලා යයි කැන්ගරු දෙසින් පැන

වසරක් ගෙවී වසරක් ඇරඹෙන මානේ
හද පිරී පැතුම් එකිනෙක පිබිදෙනවානේ
සිහිනය සැබෑවන්නට අප රජදානේ
එනවද ගුවන් තොට වෙත මගෙ සුදු නෑනේ

නත්තල් අසිරියෙන් කව්රුත් උදම් වෙති
කා බී නටාගෙන හොඳ හැටි පදම් වෙති
ඇති නැති වෙනස පිළිබඳ හිත තැවුල් නැති
මේ මිහිතලය මත ඔක්කොම රජුන් වෙති

සැම කෙනකුටම මෙහි නිවසන ලාංකික
නැහැ සිත් සතන් තුළ වෙනසක් වාර්ගික
ලෝකයෙ පළමුවැනි රටවල ආර්ථික
දියුණුව හේතුවකි යුගයක සාර්ථක

සිත ගත විඩාබර හැම මොහොතකින් මිදී
සැතපුම් සියයකට වැඩි ගමනකට යෙදී
" මොබඩන් " බෝධි වන වෙහෙරෙහි අසල රැ දී
ගත කළ දවස නම් කොහොමත් හිතට මදී

තුරුපෙළ නැගී කඳුමත එක මනාවට
හිත යොමු කළා මෙනි බණ භාවනාවට
දන් පින් කරන බොදු බැති හැම දෙනාහට
පින්බර තපෝවනයකි වන්දනාවට

ලියමන ලදිමි මම පෙරදිනයකදි ඔබේ
තොරතුරු ආදිවාසීනගෙ එමට තිබේ
ඈතට දමා ගැසුවද යළි එවෙන ඉබේ
ගෙන එමි බූමරැංගුවකුත් නමට ඔබේ

වෙනසක් නොකර මුළු ලොවටම දෙපැත්තේ
අවුරුදු මිහිර අරගෙන නව දුරුත්තේ
නව හිරු උදාවනවිට සුබ නිමිත්තේ
අපි මල් දෙකක් වෙමු පිපි එක කිනිත්තේ




මල්බර වසන්තය පිබිදෙන සතර අත
මව්බිම සොඳුරු සිතුවම් හද මවනු ඇත
ඒ සුබ සිහින මැද පිබිදෙන ඔබගෙ වත
නෑනන්ඩියට ළඟදිම මුණ ගැසෙනු ඇත

ලොව වෙන රටක නැති තොරතුරු මිහිරීතම
අයියන්ඩිගෙන් හොඳහැටි දැන ගතිමි මම
මතු දිනයකදි ඉඩකඩ ලද දිනක හෙම
ආසයි දකින්නට හිම කැට වැටෙන බිම

අතහැර දමා සමහරු සුපුරුදු වාසේ
ඩොලරය මතට නැග නැඟුවත් උපහාසේ
කරුණක් ලියා පවසමි ඔබ වෙත රාසේ
දේසේ හැටියටයි අයියන්ඩියෙ බාසේ

එළඹෙන දුරුතු මස ඇති සුබ නැකත බලා
සැමදෙන වෙහෙවෙති කටයුතු නොපිරිහෙලා
නව නිවහනෙහි වැඩ නිමවන අයුරු බලා
නෙතගට සතුටු කඳුලක බිඳු එකතු වෙලා

මිනිසුන් උදාරව ජීවත් කරවීමේ
පිළිවෙත අගය කර නවතා බලකාමේ
නව ජනපතිඳු ගෙනයන කටයුතු දාමේ
නිසැකව ගෙනේවා මව්බිම වෙත සාමේ

නෑනල සමග කවදත් මස්සිනාලයි
ලස්සන පෙනෙන්නේ නම් එක්වුනාමයි
කිරි සාගරය මත සඳරැ ස් සිනාවයි
කිසියම් මිහිරීතම රහසක් කියාලයි

ළඟඑන දුරුතු පොහොයට වන්දනාවට
තෙල්මල් රැ ගෙන ගොස් කැළණිය විහාරෙට
බුදුහිමි නැමද තෙරුවන් ගායනා කොට
ආසිරි පතමු අයියේ හැම දෙනාහට
නිමි

**ජගත් වෙත්තසිංහ**

Disney Maintenance
DM
INDUSTRIAL
COMMERCIAL
DOMESTIC
CARPET STEAM CLEANING - HARD FLOOR CLEANING & SEALING
Disney Maintenance
Rohan Tel: 03 9792 0656 Mob: 0408 106 022